**සීමාසහිත හිඟුරාන සීනි කර්මාන්තායතනය - 2015**
-------------------------------------------------------
සීමාසහිත හිඟුරාන සීනි කර්මාන්තායතනයේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. කර්මාන්තායතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
-------------------------------------------------------------------
මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**
----------------------
මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**
-----------------------------------
මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ශේෂ පත්‍රයේ, ආදායම් හා වියදම් ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේ දැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මතය ව්‍යාචනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතු කොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 අඛණ්ඩ පැවැත්ම

1993 පුද්ගලීකරණයට යටත්වූ මෙම ආයතනය 1997 දී රජයට පවරා ගත් නමුත් මූල්‍ය අර්බුද හේතුවෙන් මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. 2007 වර්ෂයේදී රජය ගත් තීරණයක් අනුව ගල්ඔය වැවිලි පුද්ගලික සමාගම නමින් වූ රාජ්‍ය සමාගමට මෙහි වත්කම්වලින් කොටසක් පවරා තිබුණි. මේ අනුව සීමාසහිත හිඟුරාන සීනි කර්මාන්තායතනය නාමිකව පවතින ආයතනයක් බවට පත්විය. රාජ්‍ය අනුග්‍රහය යටතේ සේවකයන් 09 දෙනෙකු වැටුප් ගෙවමින් පවතින මෙම ආයතනය කිසිදු මෙහෙයුම් කටයුත්තක් සිදු නොකරන අතර දිරාපත්වීම හේතුවෙන් පවතින වත්කම් ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයට පත්වී තිබුණි. මේ අනුව මෙම ආයතනයේ අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිත තත්ත්වයක පවතී.

### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01**

ආයතනය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන තුළ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

දේපල පිරියත උපකරණ පිරිවැය රු.225,853,299 ක් වූ ශේෂය තුල ඇතුළත් වූ ස්ථාවර වත්කම් වර්ග 21 කට අදාලව ක්ෂය කිරීමේ පදනම හා ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබූ බැවින් ක්ෂය ගණනය කිරීම් වල නිවැරදිතාවය පිළිබඳ තහවුරු කර ගැනීමට නොහැකි විය

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19**

වාර්ෂිකව සේවක පාරිතෝෂික සඳහා වෙන් කිරීමක් සිදුකර එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු වුවද 2015 වර්ෂය වෙනුවෙන් සේවකයන් 10 දෙනෙකු වෙනුවෙන් පාරිතෝෂික සඳහා වෙන් කිරීමක් සිදුකර නොතිබුණි.

(ඈ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36**

ආයතනයේ හිටපු අධ්‍යක්ෂවරයාගෙන් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.110,794,557 ක මුදල සඳහා අඩමාන ණය වෙන් කිරීමක් සිදුකර නොතිබුණි.

(ඉ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 40**

--------------------------------

හිඟුරාන සීනි සමාගම සතු හිඟුරානේ පිහිටි නිෂ්පාදනාගාරය, කාර්යාලය, නිල නිවස සහ ඉඩම් කොටස් අවුරුදු 30 ක කාලයක් සඳහා ගල්ඔය වැවිලි පුද්ගලික සමාගම වෙත බදු දී තිබූ අතර එම දේපල වල වටිනාකම වන රු. මිලියන 222 සහ බදු වටිනාකම වන රු. මිලියන 294 ක් ඇතුලත් රු. මිලියන 516 පිළිබඳ තොරතුරු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනම හෙළිදරව් කර නොතිබූ අතර ගල්ඔය වැවිලි පුද්ගලික සමාගම වෙතින් එම බදු මුදල් ලබාගෙන නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වත්කම්, වගකීම් හා ආදායම් වලට අදාළ ලෙජර් ගිණුම් හා ජ'නල් වවුචර් පිළියෙල කර නොතිබුණි.

(ආ) වර්ෂ ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන රු. 18,381,212 ක අවිනිශ්චිත ගිණුම් බැර ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

පහත දැක්වෙන ගිණුම් විෂයයන්වලට අදාළව ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|
| රාජ්‍ය ආයතන වලට ගෙවිය යුතු ණය | 417,083,873 | ශේෂ සනාථන ලිපි |
| රක්ෂණ ආයතනයකට ගෙවිය යුතු මුදල් | 1,462,771 | |
| වෙළඳ ණය හිමියන් සහ වෙනත් ණය හිමියන් | 83,742,852 | |
| ගොඩනැගිලි අරමුදල් | 4,862,454 | |
| ණයගැතියන් | 20,549,122 | |
| වෙනත් ණය ගැතියන් | 5,000,958 | |
| තැන්පතු හා පෙර ගෙවුම් ශේෂ | 302,016 | |
| ස්ථාවර වත්කම් | 225,853,299 | භෞතික සත්‍යාපන ලේඛන |
| පාරිභෝජ්‍ය තොග | 31,297,378 | |

**2.3 ලැබිය යුතු ගිණුම්**

-------------------

උක් වගා කිරීම සඳහා ගොවීන් වෙත ලබා දී තිබූ රු. 82,151,409 ක ණය 1997 වර්ෂයේ සිට අය වී නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 1,508,406 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 3,895,191 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 5,403,597 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයෙන් ලැබීම් පෙර වර්ෂයට සාපේක්ෂව රු. 3,187,323 කින් වැඩිවීම, දම්වැල් කුලියට දීමෙන් ලැබිය යුතු රු. 5,889,385 ක මුදල ගිණුම්ගත කිරීම මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනය කෙරෙහි බෙහෙවින් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේදී අතිරික්තයක් හා 2012 සිට 2014 දක්වා ඌනතාවයක් ලබා තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේදී එය අතිරික්තයක් බවට පත්වී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සැලකීමේදී 2011 වර්ෂයේදී ධන අගයක්ව පැවති දායකත්වය 2013 වර්ෂය වන විට ඍණ අගයක් දක්වා පිරිහී තිබුණු අතර 2014 හා 2015 වර්ෂයන්හිදී නැවතත් ධනාත්මකව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම සතු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 7465 ක් වන අතර එයින් හෙක්ටයාර් 4917 ක් ගොවීන්ට වගා කිරීමට ලබාදී තිබුණු අතර ගල්ඔය සීනි සමාගමට හෙක්ටයාර් 278 ක් හා සමාගමේ පාලනය යටතේ හෙක්ටයාර් 2270 ක් පැවතුණි. බදු දී ඇති ඉඩම්වලින් කිසිදු ආදායමක් ආයතනයට ලැබී නොතිබුණි. 1990 වර්ෂයේ කැබිනට් තීරණයකට අනුව හිඟුරානේ පිහිටි සීනි කම්හල සීමාසහිත හිඟුරාන සීනි කර්මාන්තායතනය යනුවෙන් ස්වාධීන ආයතනයක් බවට පත්විය. මෙම සමාගම 1993 දී පුද්ගලීකරණයට ලක්කර ඇති අතර 1996 දී පාලන පාර්ශවය මෙම සමාගම හැර දමා ගොස් ඇති අතර 1997 ජනවාරි 24 දින අංක 959/10 දරන ගැසට් පත්‍රයෙන් මෙම සමාගම වගකීම් සහිතව නැවත රජයට පවරාගෙන තිබුණද කිසිම නිෂ්පාදන කටයුත්තක් සිදුකර නොතිබුණි.

(ආ) හිඟුරාන සීනි සමාගමට අයත් හිඟුරානේ පිහිටි ඉඩම් කොටස් කිහිපයක් සහ කොළඹ පිහිටි ඉඩම් හා ගොඩනැගිලි පුද්ගලික සමාගම විසින් මහජන බැංකුවට උකස් කර තිබූ අතර හිඟුරාන සීනි සමාගම විසින්ද හිඟුරාන පිහිටි ඉඩම් හා ගොඩනැගිලි කිහිපයක් රු.මිලියන 280 කට උකස් කර තිබුණි. හිඟුරාන සීනි සමාගම විසින් උකස්කර තිබූ දේපලවලට අදාලව රු. මිලියන 320 ක් භාණ්ඩාගාරය විසින් බැංකුවට ගෙවා එම දේපල රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයට පවරා දී තිබුණි.

(ඇ) හිඟුරාන සීනි කර්මාන්තායතනයට අයත් ඉඩම් හෙක්ටයාර් 277.73 ක ඉඩම් හා ඊට අදාල කම්හල් ගොඩනැගිලි වර්ෂ 30 ක කාලයක් සඳහා බදු පදනම මත ගල්ඔය වැවිලි පුද්ගලික සමාගම වෙත 2007 වර්ෂයේදී ලබා දී තිබුණි. එම කාලපරිච්ඡේදය සඳහා බදු මුදල රු. මිලියන 294 ක් හා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කළ චංචල වත්කම් වල අගය රු.මිලියන 222 සමඟ රජයේ කොටස් හිමිකම රු. මිලියන 516 ක් විය. මෙම බදු වටිනාකම සඳහා ගල්ඔය වැවිලි පුද්ගලික සමාගම සමඟ එළඹී ගිවිසුමක් ආයතනය සතු නොවීය.

(ඇ) 2007 ජුනි 16 වන දින ගල්ඔය වැවිලි පුද්ගලික සමාගම සිය නිෂ්පාදන කටයුතු ආරම්භ කර තිබුණද එම සමාගම වෙත පැවරීමට අදාල වත්කම් තක්සේරු කර තිබුණේ 2009 වර්ෂයේදීය. එමෙන්ම බදු දීමට අදාලව කළමනාකරණ ගිවිසුම හා කොටස්කරුවන්ගේ ගිවිසුම වෙනුවෙන් මහා භාණ්ඩාගාරය ගිවිසුම් අත්සන් කර තිබුණේ 2009 වර්ෂයේදීය. කෙසේ වුවද මෙම ගිවිසුම් වල පිටපත් හිඟුරාන සීනි කර්මාන්තායතනය සතු නොවීය.

**5. පද්ධති හා පාලනයන්**

**---------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දූර්වලතා වරින්වර සාමාන්‍යාධිකාරීවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | ගිණුම් පොත් පත් හා ලේඛන විධිමත්ව පවත්වා නොගැනීම. |
| (ආ) ණයගැති හා ණයහිමි ශේෂ | ශේෂ තහවුරු කර නොගැනීම. |
| (ඇ) ස්ථාවර වත්කම් පාලනය | ආයතනය සතු වත්කම් හඳුනා ගෙන ලේඛනගත නොකිරීම. |